**අයගම ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් රු. 3,990,823 ක් සඳහා ගැලපීම් කර නොතිබුණි. | මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කළ යුතුවේ. | මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු ආදායමක් සේ හඳුනාගන්නා බවත්, ඌන වෙන්කිරීම හඳුනාගෙන ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | ගෙවිය යුතු අත්තිකාරම් වෙනුවෙන් මුද්දර ගාස්තු වලින් අඩුකරගෙන තිබූ රු. 1,900,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම්, වියදම් හා අනෙකුත් ගනුදෙනු පැහැදිලිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 130,409 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ එකතුව රු. 57,278 ක් වූ ජංගම නොවන වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂය තුල මිලදී ගන්නා සියළු ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදනය කර නොතිබුණි. | වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගිණුම් විෂයයන් 11 කට අදාලව මූලා ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 3,348,398 ක වෙනසක් පැවතුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (උ) | 2015 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු. 1,079,017 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**-------------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 05 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරමින් පවතින බවත්, ට්‍රැක්ටර් 04 ක්, බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩරය ඉන්ධන පිරවීම සඳහා පිරවුම්හල වෙත ගෙනයාම දුෂ්කර බැවින් ඒවායේ ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීම අපහසු බවත් දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යයසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 පරිදි කටයුතු කිරීමට සටහන් කර ගත් බව දන්වමි. |
| (ආ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යයසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගෙන යුතුවේ. | 2019 අයවැය සකස් කරන විට සභාවට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණු බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභීන්ට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුවේ. | සභාවේ වෙබ් අඩවිය මගින් සේවා ලාභීන්ට තොරතුරු දැනගැනීමේ පහසුකම් ලබාදී ඇති බවත්, සෙසු පහසුකම් ස්ථාපිත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,972,118 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,772,039 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 818,550 | 956,371 | 1,030,046 | 186,080 | 658,000 | 1,233,134 | 1,014,333 | 193,606 |
| කුලී | 5,741,320 | 6,015,289 | 6,563,855 | 130,587 | 6,221,170 | 4,656,723 | 4,512,532 | 147,376 |
| බලපත්‍ර ගාස්තු | 361,390 | 318,027 | 270,077 | 1,000 | 286,410 | 321,511 | 264,971 | 3,950 |
| වෙනත් ආදායම් | 5,209,350 | 6,042,022 | 10,935,102 | 3,997,693 | 3,849,450 | 5,057,487 | 6,368,402 | 7,040,838 |
| | 12,130,610 | 13,331,709 | 18,799,080 | 4,315,360 | 11,015,030 | 11,268,855 | 12,160,238 | 7,385,770 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 155,752 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල ඒකක 143 කින් වසර 05 ට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු. 98,170 ක් ඇතුලත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 1,961 ක් 2020 මැයි 31 වනවිට අයකර ගෙන ඇති බවත්, ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

(ආ) **ජල බදු**

| | | |
|---|---|---|
| හිඟ ජල ගාස්තු රු. 71,270 ක් අයවිය යුතුව පැවති අතර, ඉන් රු. 63,025 ක් වසර 01 ත් 03 ත් අතර කාලයකට අදාල විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 35,700 ක් 2020 මැයි 31 වනවිට අයකර ගෙන ඇති බවත්, ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

### 2.2.3 කඩකුළී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයගම සතිපොල කඩකාමර 12 කින් පෙර ගෙවුම් මුදල් රු. 540,000 ක් අයකරගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් හා ඇප තැන්පතු අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පෙර ගෙවුම් මුදල් අයකර ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන යටිතල පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සපයා ඇති සංවර්ධන යෝජනා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කරන විට එම යෝජනා ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) **අපේක්ෂිත අරමුණ කරා ලඟා නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වාර්ෂික අයවැය ලේඛනය මඟින් සංවර්ධන කටයුතු 20 ක් වෙනුවෙන් රු. 22,465,000 ක් | වාර්ෂික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ | අයවැය මඟින් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කලද වර්ෂයේදී ඉටුකල |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඉන් ව්‍යාපෘති 16 ක් ඉටුකර නොතිබූ අතර, ඒ වෙනුවට වෙනත් ව්‍යාපෘති 23 ක් ඉටුකර තිබුණි. | යුතුවේ. | යුතුවන අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා මුදල් වැය කිරීමට සිදුවන බැවින් සැලසුම් කල සියල්ල ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දිරන කසළ කලවාන කසළ බැහැරලීමේ ස්ථානයට බැහැර කර පස් තට්ටටුවකින් වසා දමන බවත්, නොදිරන කසළ වෙන්කිරීමේ මධ්‍යස්ථානයේදී වෙන්කිරීම සිදුකරන බවත් දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුල තනතුරු 10 කට අදාලව පුරප්පාඩු 13 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිළිබඳව කාර්තුවක් පාසා රත්නපුර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට හා සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට තොරතුරු ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට රු. 2,400 ක මාසික කුලියකට බදු දී තිබුණු සභාව සතු කඩකාමරයක් බදු ගැනුම්කාරිය විසින් බදු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව තෙවන පාර්ශවයක් වෙත රු. 12,000 ක මාසික කුලියකට අතුරු බදු දී තිබුණු අතර, කඩකාමර කුලිය වසර 05 කට වරක් තක්සේරු කර ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු බදුදීම් සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළයුතු අතර, දේපල තක්සේරු කර බදු කුළිය සංශෝධනය කළ යුතුවේ. | අතුරු බදුදීම පිළිබඳව බදු ගැනුම්කාරිය දැනුවත් කල බවත් තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කලද මෙතෙක් ඒ සම්බන්ධයෙන් තක්සේරුවක් ලැබී නොමැති බවත් දන්වමි. |